
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 ජූනි 04 සඳුදා
04 වෙළුම - 32 කලාප
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු. 10.00

# ළමා ප්‍රදීපය



## දේව වචනයේ වසර

## පුංචි ඔබත් දේව වචනයෙන් සවිමත් වන්න

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# 'දේව වචනය' පුංචි ඔබට මහත් සවියක් විය යුතුයි.

## ආදරණීය දුවේ පුතේ...

කොළඹ - අගරදගුරු පදවිය මුල්කොට ගෙන දේව වචනයේ වසර ප්‍රකාශයට පත් කළේ පසුගිය අවුරුද්දේ එනම් 2011 වසරේ අගෝස්තු මස සිටයි. ඔබට මතකයි නේද? එදා තේවත්ත පුදබිමේදී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඇතුළු සියලු පැවිදි , පූජක තුමන්ලා පෙරටු කොට ගෙන ගිහි ජනතාව ඉදිරියේ විශේෂාකාරයෙන් මෙම වසර ප්‍රකාශයට පත් කළ අයුරු. ඉතිං මේ දේව වචනයේ වසර ඉතා ප්‍රබලව අප මීසම් අතර කථා බහටත්, ඒ වගේම ඒ වසර මුල් කොට ගෙන විවිධ ආධ්‍යාත්මික ක්‍රියාකාරකම් ඉටු කිරීමටත් ඒ මීසම් වල බොහෝ දෙනෙක් කැප වුනා. තවමත් නොනිමි භක්ති ක්‍රියාකාරකම් රැසක් දේව වචනයේ වසර මුල් කොට ගෙන ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ආදර දුවේ පුතේ, කතෝලික විශ්වාසය සම්පූර්ණයෙන්ම රැඳී පවතින්නේ දේව වචනය තුළයි. ශු. බයිබලයේ ග්‍රන්ථ ක්‍රමිකව පෙළ ගස්වා එහි පැරණි ගිවිසුම, අලුත් ගිවිසුම යනුවෙන් බාණ්ඩ වෙන් කොට ඒ සියලු ක්‍රියාකාරකම් මුල් යුගයේ පටන්ම ඉටු කළේ කතෝලික සභාවයි. විශේෂයෙන්ම, දිව්‍ය පූජාව තුළ මෙම ශුද්ධවූ ලියැවිල්ල මුල්කොට ඒ ගිවිසුම් දෙක අතර මනා සම්බන්ධයක් ඇති කරවන අයුරු අපිට දිනපතාම දිව්‍ය පූජාවට සහභාගි වීමෙන් අවබෝධ කර ගන්නට පිළිවන්. අපේ ජන වන්දනාව තුළ රැඳී පවතින සෑම භක්ති අභ්‍යාසයකම මූලික අරටුව දේව වචනය හා සමග සම්බන්ධ වේනවා. අද ශු. සභාව තුළ වැඩිපුරම කථාවට ලක්වන කුඩා කිතුනු සංඝ පවා ආරම්භ කරණ්නටත් එහි ක්‍රියාත්මික බව පසක් කරන්නටත් මුල් වී තිබෙන්නේ දේව වචනයමයි.

ආදර දුවේ පුතේ, කතෝලික විශ්වාසය තුළ අපි හැම කෙනෙක්ම යන්නේ නිමා නොවන ගමනක් බව අමතක කරන්න එපා. මේ නිමා නොවන ගමන් මඟ නිසා කිතුනු ජීවිතය බොහෝ විට නම් වන්නේ කුඩාරම් ජීවිතයක් හැටියටයි. විවිධ පරිසරයන් තුළ, විවිධ ජන සංයුතින් අතර ජීවත් වීමේදී එකිනෙකාට ඇති වන්නේ, මුහුණ පාන්නට සිදුවන්නේ නිමක් නොමැති ප්‍රශ්න, කම් කටොලු රාශියකටයි. දෛනිකව අප හැම කෙනෙක් හටම ජීවිතයේ විවිධ ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිදුවනවා වගේම, ඇතුලාන්ත ජීවිත ගැටලු හා ප්‍රශ්න වලටත් අපි නිරන්තරයෙන්ම මුහුණ දෙනවා. බොහෝ වෙලාවට ජීවිතයේ ඇතිවන මේ ප්‍රශ්න තුළ ඒ ප්‍රශ්න හා එක්ව ජීවත් වන අය තුළ නිරායාසයෙන්ම ඇති වන්නේ හිස් භාවයක්. නැතිනම් මහා විශාල කණස්සල්ලක්. මෙහිදී බොහෝ දෙනෙක් උත්සහ කරන්නේ තමන්ගේම ජීවිතයෙන් පළිගන්නටයි. නමුත් දේව වචනය තුළ ස්ථිරසාරව ජීවත් වන්නාට නියම පිළිතුරු හා සහනය දේව වචනය තුළම ගැබ්වී පවතිනවා. දේව විශ්වාසයෙන් එලෙස දේව වචනය තුළ ජීවත්වන්නා හට පුදුමාකාර සහනයක් හා නිත්‍ය පිළිතුරක් දේව වචනය තුළම සම්භවන නිසා කිසිදක එම තැනැත්තා හෝ තැනැත්තිය ජීවිතය හිස් භාවයකින් පුරවා ගන්නේ නැහැ. කළකිරුණු ස්වභාවයට ගෙන එන්නේ නැහැ.

ඉතිං ආදර දුවේ පුතේ අපි කුඩා කාලයේ පටන්ම දේව වචනය තුළ ඉතා ගාම්භීර අයුරින් හා ගැඹුරින්ම ජීවත් විය යුතු වෙනවා. අභාග්‍යයකට , අද තැන තැන කුඩා කණ්ඩායම් බයිබල් කණ්ඩායම් කියලා ගෙයින් ගෙට ගොස් මෙම දේව වචනය විකෘති කරනවා. නමුත් කතෝලික සභාව තුළ වැඩෙන දරුවෙක් කිසිමදක දේව වචනය හා සමග සෙල්ලම් කරන්නේ නැහැ. ඒ උත්තරීතර දහම් පණිවිඩය හෑල්ලු කරන්නේ නැහැ. මූලධර්මවාදීන්ට පැවැත්මක් හා සම්ප්‍රදයක් නැති නිසා ඔවුන් කරන්නේ දේව වචනයේ ඇති අන්තර්ගත පණිවිඩය වචනාර්ථයට පමණක් සීමා කොට කථා කිරීමයි. එවිට ඔවුන්ගේ පහසුවට වචනාර්ථයෙන්ම ජනතාව බය කිරීමට ඔවුන් උත්සහ කරනවා.

කතෝලික අපි හැම කෙනෙක්ම දැන් අවබෝධයක් ඇතිව ජීවත් වන නිසා වචනාර්ථය නොව ඊට ඔබ්බට අති තත්ත්වාකාරයන් කාල වකවානුවන් ඊට අයත් ජන සංයුතියත් ගැන හැදෑරීමටත් දේවවචනය යොමු කරන නිසා දේව වචනයේ සැබෑ පෝෂණ ගුණය දෙවා ලන්නට මහගු ශක්තියක් ලබා ගෙන තිබෙනවා. දේව වචනයේ සහන් එළිය අපේ ජීවිත වලට බලවත්ව දැනෙන්නේ ඒ නිසාමයි. අපිට බයිබලය පරිශීලනය කරන්නට කුඩා කලයේ පටන්ම සූදනමක් තිබෙන්නට ඕනා. දැන් බයිබලය පරිශීලනය කරන්නට උදව් වන අත් පොත් ගණනාවක්ම කුඩා ප්‍රමාණයෙන් සිංහල භාෂාවෙන් පිටවී තිබෙනවා. බයිබලය පිළිබඳ විශාරද දැනුමක් ඇති අය එම පොත්පත් ලියා තිබෙන නිසා ඉතා සරලව හොඳ අවබෝධයක් ලබා ගැනීමට එම පොත් පත් ආශ්‍රයෙන් ඔබටත් අත් විඳින්නට පුළුවන්.

ඉතිං ආදර දුවේ පුතේ, මේ දේව වචනයේ වසර ගත කරන අපි, මීටත් වඩා දිගු අඛණ්ඩ ගමනක් යන්නට හොඳ අඩිතාලමක් දමා ගත යුතුයි. මේ වසර තුළ නිරන්තරයෙන්ම සිහිපත් කරවන විවිධ අභ්‍යාස කටයුතු ඒ පරිශීලනයට හා අන් දැකීමට හොඳ පිටිවහලක්, කතෝලිකයා තුළ දේව වචනයට ඇති ගැඹුරු ආදරය හා ප්‍රේමය තව තවත් වර්ධනය කරන්නට ජේසු සමිඳුන්ගේ පිහිට පතා අප දිනපතා යාච්ඤා කරමු. ඒ ශක්තිය පුංචි ඔබට ස්වාමීන් වහන්සේගේ ආශිර්වාදයෙන්ම ලැබේවා.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# ශ්‍රී ලංකාවේ නත්තල් මුද්දර ඉතිහාසය.....

1980 දී කොළඹ පිහිටි මුද්දර කාර්යාංශය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රථම නත්තල් මුද්දරය නිකුත් කරන ලදී. එම ඓතිහාසික කටයුත්ත සඳහා වසර ගණනාවක් සිට මහත් උනන්දුවක් හා පරිශ්‍රමයක් දැරුවේ දැනට ගාලු පදවි යේ විශ්‍රාමික රදගුරු අති උතුම් එල්මෝ පෙරේරා රාජගුරු ප්‍රසාදීන් වහන්සේය. එවකට එතුමා ගරු පූජාප්‍රසාදීන් වහන්-සේ නමක් වූ අතරම උද්‍යෝගිමත් මුද්දර එකතු කරන්නෙක්ද විය. ඒ සමඟම එම කාලවකවානුවේදී කොළඹ පදවියේ සහයක රදගුරු හිමි ලෙස කටයුතු කළ ක්‍රිස්තියානි සංස්කෘතික කටයුතු භාරව සිටි අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් රාජගුරුප්‍රසාදීන් වහන්සේගෙන් මේ සඳහා ලද අනුග්‍රහය හා දැරූ වෙහෙස මහන්සිය කිසිසේත් අමතක කළ නොහැක.

මුල්ම නත්තල් තැපැල් මුද්දරය සඳහා සුදුසු අකෘතියක් තෝරාගැනීමට මුද්දර නිර්මාණ තරඟයක් පැවැත්විය. එනමුත් එමගින් ඒ සඳහා සුදුසු නිර්මාණයක් නොලැබුණි. මේ අතරතුර ගරු එල්මෝ පෙරේරා පූජාප්‍රසාදී තුමන්ට දැන ගැනීමට ලැබුණා. එවකට පූජකවරය සඳහා ජාතික දෙව්සත්හලේ ඉගෙනුම ලබන දහඅට හැවිරිදි චිත්‍ර කලාවට දක්ෂ ප්‍රියන්ත සිල්වා පූජක සිසුවා ගැන (එතුමා අද කොළඹ පදවියේ ගරු ප්‍රියන්ත සිල්වා පියතුමාය.) ගරු එල්මෝ පෙරේරා පියතුමා එම උතුම් කර්තව්‍යයට එම පූජක සිසුවාට බාර කළේය. එම කාලයේ දෙව්සත්හලේ අධ්‍යක්ෂකධූරය දැරූ ගරු කිංස්ලි සී. ජයමාන්න පූජාප්‍රසාදීතුමාත්, ගරු බෙනඩික් ජෝසප් පූජාප්‍රසාදීතුමාත්, කලා උපදේශක ප්‍රැන්සිස් ප්‍රනාන්දු මහතාත් මේ සිසුවා ඒ සඳහා උනන්දු කර ඔවුන්ගේ සහයෝගය මත

## මුද්දර ලෝකය



## හඳුනා ගනිමු

**ඉදිරිපත් කිරීම :- සිරිල් පෙරේරා - මල්කඩුවාව**

ප්‍රියන්ත සිල්වා පූජක සිසුවා විසින් ඉතා දර්ශනීය දේශීය ඌරුවට ගැළපෙන නිර්මාණයක් ලංකාවේ ප්‍රථම තැපැල් මුද්දරය සඳහා බිහි කළේය. එම අවධියේ මුද්දරයකට චිත්‍රයක් නිර්මාණය කළ ලාබාලම චිත්‍ර ශිල්පියා ඔහු වූ අතර, එයින් ලද පන්නරය හේතුවෙන් ඉන්පසු වසර කීපයකම නත්තල් මුද්දර 12 ක් නිර්මාණය කිරීමට ඔහු දායක විය.

එදා 1980 වසරේ නිකුත් වූ ලංකාවේ ප්‍රථම නත්තල් මුද්දර දෙකෙන් එකක පිළිබිඹුවූයේ රජතුන්කට්ටුවේ චිත්‍රයක් වූ අතර අනෙකෙක් දැක්වූයේ දේශීය ඌරුවට ඇඳි ශුද්ධ වූ පවුලේ චිත්‍රයයි. එය එම වසරේ සාන්ත සභාවේ තේමාව වූ **"පවුලේ වසර"** (Year of the Family) හා සමගාමීව බැඳුණි. පසුගිය වසර තිහක කාලය තුළ දී වසර හතරක් හැරෙන්නට

*එදා 1980 වසරේ නිකුත් වූ ලංකාවේ ප්‍රථම නත්තල් මුද්දර දෙකෙන් එකක පිළිබිඹුවූයේ රජතුන්කට්ටුවේ චිත්‍රයක් වූ අතර අනෙකෙක් දැක්වූයේ දේශීය ඌරුවට ඇඳි ශුද්ධ වූ පවුලේ චිත්‍රයයි.*

අනෙකුත් සෑම වසරකම කිතුනු අප වෙනුවෙන් නත්තල් මුද්දර 54 ක් මේ වන විට නිකුත් කර තිබීම ගැන මුද්දර කාර්යාංශයට අප සැමගේ ප්‍රශංසාව මුසු ස්තුතිය හිමිවිය යුතුවේ. ලක්දිව ප්‍රධාන පෙළේ කලාකරුවෙක් වූ ඩේවිඩ් පේන්ටර්, සිබිල් වෙත්තසිංහ, කලාභූෂණ එස්. එස්. සිල්වා මෙන්ම දිවයිනේ නොයෙක් පළාත්බද පාසල් දරුවන්ගේ මනරම් නිර්මාණ වලින් එම මුද්දර හැඩගැන්වී ඇත. එකී බොහෝ නිර්මාණයන් දේශීය ඌරුවට මෙන්ම අපගේ සංස්කෘතික ලක්ෂණවලට අනුරූපී වීම නිසා කිතුනු දැක්ම කෙතරම් දුරට අප දේශය තුළ මාංශගතවී ඇත්දැයි මනාව සනිටුහන් කෙරේ

සාන්ත සභාවේ විවිධ නත්තල් තේමාවන්ට අදාලව අප දිවයිනේ වසරක් පාසා මුද්දර නිර්මාණ තරග පවත්වා එමගින් සුදුසු නිර්මාණයක් එම වසරේ නිකුත් කරන නත්තල් මුද්දරය සඳහා තෝරා ගනු ලැබේ. මෙම තරගයට ඉදිරිපත් වී ජයග්‍රහණය කළ කුඩාම චිත්‍ර ශිල්පියා වන්නේ මහනුවර කිං-ස්වුඩ් විදුහලේ පළමු වසරේ ඉගෙනුම ලැබූ මිනුර රණතුංග සිසු දරුවාය. පසුගිය කාලය පුරා මෙලෙස රටේ විවිධ පාසල් වල ඉගෙනුම ලබන බෞද්ධ මුස්ලිම් කිතුනු සිසු දැරියන් කීප දෙනෙකුගේ චිත්‍ර නත්තල් මුද්දර සඳහා යොදාගෙන තිබේ. ආගම් භේදයකින් තොරව නත්තල අප කාගේත් පොදු ජාතික උත්සවයක් ලෙස පිළිගැන්වීමට මෙයත් එක් සංකේතාත්මක පිළිවෙතකි.

වසර 2005 දී නිකුත් කරන ලද නත්තල් මුද්දර දෙකෙන් එකක් නිර්මාණය කර තිබුණේ කුරුණෑගල චිත්‍ර ගුරු වරයෙකු වන නලින් සමර වික්‍රමයි. (ඔහු කුරුණෑගල පදවියේ ''පහන් ටැඹ'' සඟරාවේ පිට කවර නිර්මාණය සඳහාද දායක වී තිබේ.)

සමහර වසරවල මෙම නත්තල් මුද්දර කාණ්ඩය හා සමගාමීව දිවයිනේ ප්‍රසිද්ධ කතෝලික දේවස්ථානයක චිත්‍රයක් හෝ දෙව්මැඳුරු තුළ කිතුනු අනන්‍යතාවය හුවා දක්වන රංජිත විදුරු ජනේල (Stained Glass) පිළිබිඹුවක චිත්‍රද, සම්ප්‍රදායික කිතුනු ලාංඡනයක් දක්වන රවු-පද, දේව මෑණියන්ගේ සුරුවම්ද දැක්වෙන නිර්මාණයන් අඩංගු මුද්දරද එළිදක්වා ඇත.

මේ සියල්ලෙන්ම කිතුනු අපේ උරුමයන් හා කිතු දහම සතු අනන්‍යතා ලක්ෂණ මෙන්ම ජේසු තුමන්ගේ කථාන්දරයද, රටට කියාපාන්නේය. නාට්‍ය, ංගීතය, සිනමාව, ලේඛන කලාව යනාදි ජනමාධ්‍යයන් ඔස්සේ එදා මෙදා කැපීපෙනන ලෙස කටයුතු කළ කිතු දැක්ම සන්නිවේදනය කිරීමෙහිලා දිගින් පළලින් සෙන්ටිමීටර් කීපයකින් සමන්විත මුද්දරයකින් ද ඉටුකළ හැකි බව මෙයින් සනාථ වන බව පැහැදිලි වන්නේය.

# මෙරට දැනට පළවන ඉපැරණිම සිංහල පුවත් පත

ශ්‍රී ලංකාවේ අදටත් පළවන ඉපැරැණිම සිංහල පුවත්පත කුමක්දැයි දූලා - පුතාලා දන්නවාද ? ඥානාර්ථ ප්‍රදීපය එම පුවත්පතයි. එම පුවත්පතට ජූනි මස 07 වැනිදාට වසර 147 ක් ලබයි. ඥානාර්ථ ප්‍රදිපය සැබෑ කිතුනු උරුමයක් හෙයින් මෙවර එහි අතීතය ගැන ඔබ සමඟ අදහස් බිඳක් බෙදා ගැනීමටයි මගේ සූදානම.

ඒ කාලයේ මුද්‍රණාල මෙරට කොහේවත් නොවීය. ඕලන්ද සමයේ දී සිංහල අකුරු යොදා පොත්පත් අච්චු ගසන්නට පටන් ගත් අතර ජොඅන්නෙස් රූල් නම් ඕලන්ද දේවගැතිතුමන් විසින් 1699 දී විරචිත ඕලන්ද බසින් රචනා කරන ලද බයිබලය සිංහල බසට පෙරැළිණි. සිංහල ව්‍යාකරණයට අවැසි සිංහල අකුරු ඕලන්දයේදී සකස් විය. ඒ අනුව හෙළ බසින් යමක් මුල්වරට මුද්‍රණය වූයේ ඕලන්දයේ (අද නෙදර්ලන්තයේ) ඇමස්ටර්ඩෑම් නුවරදීය. 1737 දී ඕලන්ද ආණ්ඩුව සිංහල බසින් කුඩා යාච්ඤා පොතක් මෙරට අගනුවරදි මුද්‍රණය කළේ ඔවුන් කොළඹ නගරයේ ඇරැඹූ මුද්‍රණාලයේදිය. 1815 දී වෙස්ලියන් වරුන් කොළඹ දීද. 1832 දී එංගලන්ත සභාවේ අය කෝට්ටේදී ද මුද්‍රණාල අරඹා ආගමික පතපොත මුද්‍රණය කළහ. 1832 සිට 1835 අතරේ ඉංග්‍රීසි හා සිංහල ද්වි භාෂාවෙන් කුඩා සඟරා දෙකක්ද, 1839 සිට ලංකා නිධා-නය නමින් මාසික සිංහල සඟරාවක්ද ඇරැඹූ නමුත් ඒවායේ ආයුෂ දිගු නොවීය.

1843 නොවැම්බර් 12 විවෘත කළ රෝමානු කතෝලික මුද්‍රණාලයෙන් මුල් වරට සිංහල බසින් නිකුත් වූයේ දොන් දොමින්ගු විජේසිංහ මුහන්දිරම් තුමන් විසින් ඉංග්‍රිසියෙන් හෙළ බසට පෙරලන ලද ක්‍රිස්තියානි ඉගැන්වීම් ග්‍රන්ථයයි.




1846 මාර්තු මස සිට කොළඹ සද්ධර්ම සංග්‍රහය නමින් ද්වි භාෂා ඉංග්‍රිසි සිංහල පත්‍රිකාවක් කතෝලිකයෝ ආරම්භ කළහ. දොන් දොමින්ගෝ විජේසිංහ මුහන්දිරම් තුමාගේ කර්තෘත්වයෙන් පළවූ මේ පත්‍රිකාව වසරකින් නතර විය. එතුමාගේ වෑයමෙන් 1852 දී මහනුවරදී පටන් ගත් ලංකා අභිවෘද්ධිය ඒ වසරේ මාර්තු සිට දෙසැම්බර් දක්වා පළවී නතර විය.

සැබෑ පුවත්පතක හැඩරුව ගත් මුල්ම සිංහල පුවත් පත




1860 දී ඩබ්ලිව් පී. රණසිංහගේ කර්තෘත්වයෙන් ලංකාලෝකය ලෙස පළ විය. 1863 දී ලක්මිණි පහන ද. ඊට එදිරිව කරෝලිස් වීරක්කොඩි විසින් ලක් රිවි කිරණ මැයෙන් තවත් පුවත් පතක් ද ඒ වසරේදීම පළ විය. කොග්ගල පඬිතුමා 1862 දී යළි ලක්මිණි පහන වඩාත් ප්‍රසිද්ධියක් ලබා ඇරැඹූ අතර කතෝලිකයෝ සි.ඩී. ඇම් බෙනඩික් මහතාගේ කර්තෘත්වයෙන් අරුණෝදය මැයෙන් ඇරැඹූ සඟරාව 1865 දි නතර විය.

මේ සියලු පුවත්පත් කාලයාගේ ඇවෑමෙන් නතරවූ අතර 1866 ජූනි 07 වැනිදා ගරු පිටර් ඉලාරි පියතුමාගේ අධ්‍යක්ෂකත්වයෙන්. කතෝලික පාඨශාලාචාර්ය වරයකු වූ කොළඹ මෝදර ෆිෂර්ස් හිල්හි ජුවන් ප්‍රනාන්දු මහතාගේ කර්තෘත්වයෙන් ඥානාර්ථ ප්‍රදීපය සතිපතා පුවත්පත ආරම්භ කැරිණ. ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පුවත්පතක්වූ එහි ප්‍රකාශනය

ලංකාවේ හවුල් ගණන් නියමවූ කතෝලික සමාගමට පැවරුණ අතර මුල් මුදල පවුම් 2000 ක් විය. එය මුද්‍රණය වූයේ කොටහේන සාන්ත ලුසියා ආසන දෙව්මැදුරට යාබද අනත් දරු මුද්‍රණාලයේදීය.

එදා මෙදා තුර වසර 147 ක් තිස්සේ කාලයාගේ අභියෝගයන්ට මුහුණ දෙමින් සපැමිණි ඥානාර්ථ ප්‍රදීපයේ ප්‍රධාන කර්තෘවරුන් මෙසේය. ජුවන් ප්‍රනාන්දු මහතා, තෝමස් අම්බ්‍රෝස් ජයවර්ධන මහතා. වි. චාර්ල්ස් පෙරේරා මහතා, ගරු ජෝන් පහමුණේ පියතුමා, ඒ.ජේ. දබරේරා මහතා. ඩී.පී. කුරුකුලසූරිය මහතා, ගරු මර්සලින් ජයකොඩි නි.ම.නි ගරු ඉග්නේෂස් ගම්ලත් පියතුමා, අතිඋතුම් ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමි, අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් විශ්‍රාමික අගරදගුරු හිමි, ගරු ජෝ. ඒ. වික්‍රමසිංහ පියතුමා. හෙක්ට වෙල්ගම්පල මහතා, ප්‍රැන්සිස් ලියනාරච්චි මහතා, ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා, ගරු බෙනඩික් ජෝශප් පියතුමා, ගරු සිරිල් ගාමිණි ප්‍රනාන්දු පියතුමා හා වත්මන් ගරු සාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා ආදීහු වෙති. ඥානාර්ථ ප්‍රදීපයේ සියවස සමඟ 1966 මැයි 07 දා ළමා ප්‍රදීපය නමින් අතිරේකයක් පුවත්පත සමඟ ඇරඹුණු අතර කාලයාගේ ඇවෑමෙන් ළමා ප්‍රදීපය වෙනම පුවත්පතක් බවට 2008 ඔක්තෝබර් 06 වැනිදා පත්විය. ආසියාවේ දැනට පළවන එකම කතෝලික ළමා පුවත්පත ළමා ප්‍රදීපය බැව් සිහිපත් කරන්නේ මහත් සොම්නසිනි !

ශිරාන් මෛත්‍රි

# පන්සලේ පියතුමා



ගරු මර්සලින් ජයකොඩි පියතුමා

ආදරණීය නංගි මල්ලි, මල්පැළේ උපන් පන්සලේ පියතුමා ලෙස විරුදාවලියලත් ගරු මර්සලීන් ජයකොඩි පියතුමාගේ ජන්ම දිනය යෙදිලා තියෙන්නේ ජුනි මස 03 වෙනි දිනට.

1902 ජුනි මස 03 වන දින දංකොටුව ගොඩැල්ල නම් ග්‍රාමයේ තමයි ගරු මර්සලීන් ජයකොඩි පියතුමා ඉපදිලා තියෙන්නේ. දිවියිනේ විවිධ ප්‍රදේශවල සේවය කර ඇති පියතුමා භාෂා හතක් පමණ දැන උගත් කෙනෙක් වගේම ජාතික සමගිය, ආගමික සහජීවනය ගොඩනගන්නට කටයුතු කළ අයෙක්, දක්ෂ ගී පද රචක යෙක්, සංගීතඥයෙක් සහ කවියෙක්ද වෙනවා. ගරු පියතුමා ළඟ තිබූ සංගීත හැකියාව නිසාම ආනන්ද සමරකෝන් ශූරීන් ලියූ අප රටේ ජාතික ගීය කොළඹ මියුසියස් විදුහලේ ශිෂ්‍යාවන්ට පුරුදු පුහුණු කරවමින් එය ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ගායනා කරවීමේ ගෞරවයද හිමි වන්නේ ගරු මර්සලීන් ජයකොඩි පියතුමාටයි. එතුමා දක්ෂ කවියෙකු වූ නිසා ශ්‍රී ලංකා කවි සම්මේලනයේ සභාපති ධූරයටද හිමිකම් දැරුවා . ගරු පියතුමා බොහෝ දේ සමාජයට තිළිණ කරදී තිබුනේ කවියෙන් සහ ගීයෙන්. ඒ නිසාම එතුමා සැම සිත් තුළම අමරණීය චරිතයක් බවට පත්වුණා. අපි නත්තල සැමරිය යුතු ආකාරය සහ බුදු දහමේ හරය පියතුමා දැක්කෙ මෙන්න මේ ආකාරයට.

"මගෙ නත්තල දුගියා බත් කන දාය
මගෙ නත්තල වැරහැලි නැතිවෙන දාය
මගෙ නත්තල ඔබෙ දුක සැනසෙන දාය
මගෙ නත්තල පව පල්ලිය යන දාය "

"නෙත යන යන තැන වෙහෙරක් පෙනීයන්
වෙහෙරක් නැති තැන වෙහෙරක් තැනීයන්
ඉන් එන පණිවිඩය නුවණට දැනීයන්
දුටු දුටු විට සිත තුළ සිල් ගැනීයන්"

දේශිය කිතුනු සාහිත්‍ය දියුණු කිරීමෙහිලා පුරෝගාමියෙකු වූ ගරු පියතුමා විසින් රචිත ගීතිකා බොහෝය. " නෙළුම් පිපීලා" ගීතිකාව එතුමා විසින් රචිත ප්‍රථම ගීතිකාව වන අතර "රෑ තරු බබලනවා" "ජේසු රජාණෙනි", "සුවඳ ජලේ" , "ඔබයි අපේ රාණි" යන ගීතිකා ද එතුමාගේ නිර්මාණයන් ය. එමෙන්ම එතුමා විසින් "රේඛාව " චිත්‍රපටය සඳහා ප්‍රබන්ධ කළ "සීගිරි ළඳකගේ" හා "වෙසක් කැකුළු " යන ගීත අදත් ජනප්‍රිය මට්ටමක ඇත. මෙතුමා විසින් සිදු කළ මෙම අමිල මෙහෙවර උදෙසා මැග්සේසේ සම්මානය, ජනාධිපති සම්මානය ආදී සම්මාන රැසක් එතුමාට පුදනු ලැබීය. මෙසේ ජගත් පූජිත සම්මානයන්ගෙන් කීර්තිමත්ව විසූ මේ මහා සාහිත්‍යධරයා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම "-දෙවියන් ගේ ළගම නෑදැයෙකු වූ මහා කවියා" අන්තිමේ පුරා අවුරුදු අනූ හයක් ආයු වළඳා වර්ෂ 1998 ජනවාරි 15 වනදා ස්වර්ගස්ථ වුණා.

**ඩබ්. අචිනි ශෙනාලි ප්‍රනාන්දු**
**11 ශ්‍රේණිය**
**බාලිකා මහා විදුහල , දංකොටුව**



හාල්දඬුවන සාන්ත මරියා දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී 2 වන ශ්‍රේණියේ දූ පුතුන් ඉදිරිපත් කළ ප්‍රසාංගික අවස්ථාවකි මේ.

**ටෙක්ලා කල්දේරා**

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව



★ අභිවෘද්ධි ආලේපනය ලැබුවකුගේ යුතුකම් කවරේද?

- විශ්වාසය ස්ථිරව ප්‍රකාශ කිරීම
- අපෝස්තුළුවරයාගේ කාර්යය ඉටු කිරීම ශුද්ධ සභාව භාරකරනය
- වගකීම් භාරගැනීම
- ලෝකය ශුද්ධවත් කිරීමේ කාර්යයට එක්වීම
- විශ්වාසයට විරුද්ධ වූ බලවේගයන්ට එරෙහිව නිර්භීතව සටන් කිරීම

★ ශුද්ධාත්ම දීමනා හත නම් කරන්න.

- ප්‍රඥාව - ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූ සත්‍යතාවක පැහැදිලි ලෙස දැකීම, තේරුම් ගැනීමට හැකියාව ලැබේ. බුද්ධිය නිසි මග මෙහෙයවිය යුත්තේ ප්‍රඥාව මගිනි.
- තේරුම්ගැනීම - එම සත්‍යතාවයන් අර්ථාන්විතව තේරුම් ගැනීම.
- දැන ගැන්ම - එම සත්‍යතාවයන් විශ්වාස කළ හැකි බව, විශ්වාස කළ යුතු බව.
- දැනමුතුකම - ඒ ඒ ජීවිත අවස්ථාවලදී අපි කුමක් කළ යුතුද? නොකළ යුතුද? යන්න තේරුම් ගැනීමට
- ධෛර්යය - අන් අයට මග පෙන්වීම, නිවැරදි දේ කිරීමට ඇති ආත්ම ශක්තිය
- දේව භක්තිය - දෙවි පියාණන්ට මහිමය දීමට, ප්‍රශංසා කිරීමට, ඇදහිල්ලෙන් යුතුව යාච්ඤා කිරීමට නැඹුරුව
- දේව භය - දෙවියන් වහන්සේ වෙත නිසි ගරුත්වය, අනිත් දීමනාවන්ට අත්තිවාරම මෙය වේ.

★ ශුද්ධාත්ම ඵල 12 නම් කරන්න.

- ස්නේහය
- ප්‍රීතිය
- සමාදානය
- ඉවසීම
- කරුණාව
- යහපත්කම
- නොබිඳෙන දිරිය
- සාන්තදාන්තකම
- විශ්වාසවන්තකම
- මර්‍යාදාවය
- ව්‍රතභාවය
- පිරිසිදු කම

★ මුල් කිතුනු සභාවේ ලක්ෂණ 05 ක් නම් කරන්න. (ක්‍රියා 2/42-47)
(ක්‍රිස්තු උත්ථානයෙව් පසුව ක්‍රිස්තියානි සභාවේ ගිහියෝ කල්ගත කළේ කෙසේද?)

- ඉගැන්වීම
- සහභාගිකම
- රොටී කැඩීම
- යාච්ඤාවේ නිරත වීම
- සැදැහැවත් සියල්ලො එක් වී හැම දෙයම පොදුවේ තබාගැනීම
- දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් හා සියල්ලන්ගේ ප්‍රසාදය ලබමින් ද කල් යැවීම. (ක්‍රියා 2/42-47)

★ ''ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. යමෙකු වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද, නූපන්නොත්, ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකිය'' යයි ක්‍රිස්තුන් වහන්සේ පැවසුවේ කාටද?

- නිකොදේමුස්ට

★ ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධාත්ම වරමින් පූර්ණ වී සිටි බවට උදාහරණ තුනක් දක්වන්න.

- ජේසුස් වහන්සේ බලය ඇත්තකු සේ ක්‍රියාකාරී වීම.
- ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් යුක්තව ගලීලයට පෙරළා වැඩීම (ලූක් 4/14)
- ජේසුස් වහන්සේගේ මානව දයාව සොයා ජනතාව වෙත පැමිණීම
- තමන්ගෙන් ප්‍රශ්න කළ අයට ජේසුස් වහන්සේ ඥානවන්තව පිළිතුරු දීම ද
- ජනතාව ජේසුස් වහන්සේගේ ප්‍රේමය අත්දැකීම
- දේව පනත්වලට අනුව ජීවත්වීම

ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

# අලුත් පෑනක්



“මදැයි අලුත් පාසලකට ගියා. අදත් ගුටි දෙකක් වැදුනා....”

පොත් ටික මේසය මත තබා අම්මාට ඇසෙන සේ මදක් ඇස් හඬින් මම කතා කළෙමි.

“හෙට නම් මම ඉස්කෝලේ යන්නෙම නෑ....”

“ඇයි? පහුගිය දවස්වල රුපියල් තිහ, හතලිහක් වියදම් කරලා පොත් පත්, ඇඳුම් අරන් දුන්නෙ, ගෙදර තියාගන්ට තමයි.... අම්මාගේ කරුණා විරහිත ඒ වදන් වලින් මගේ හදවත තවත් පෑරෙයි.

‘මොනවා අරන් දුන්නත් අම්මේ, මට පෑනක් නැතුව ඉස්කෝලේ යන්න බැහැ. අදත් ගුටි දෙකක් වැදුනා. දෙනෙතට නැඟුණු කඳුළු මගේ කටහඬ අඩපණ කළේය. කෝටු පාර වැදුන වේලෙහිවත් මේ තරම් වේදනාවක් මට නොදැනින. ඒත් ...එදා කෙල්ලො රැලකගේ සමච්චලයට ලක්වුන දවසේ මීටත් වැඩිය වේදනාවකින් හදවත පෙළුන හැටි නම් මට තවම මතකයි.

“ගමයන්ට කොහෙන්ද බං මේවල තැනක් ” සරඹ මිස් බනින කොට උන් එහෙම කියල කොච්චර හයියෙන් හිනහ වුනාද?




“යන්ට බැරි නම් ගෙදර හිටපන්. මේ ටිකට රුපියල් තිහ හතලිහක් උඹට වියදම් කළේ අතේ මිටේ තිබිලද? තාත්තාද අම්මාගේ වචනයම අනුමත කළේ මගේ වේදනාව තේරුම් නොගෙන වෙන්නැති.”

අසරණවූ මා කරත්ත පාරේ පාලු තැනක වාඩි වූයේ දඟකාර කොලුවකුගේ විලාසයෙනි. ඒත් ... මට ඒ ඉරියව්වෙන් වැඩි වේලාවක් ඉන්නට නොලැබුනි.

“විකේ රංජනී, මොකද මේ.... කොල්ලෙක් වාගේ පාරේ වැටිල ඉන්නේ චි: ලැජ්ජ නැද්ද?

පහල ගෙදර නෝනාගේ සරදමින් මට ඇති වුයේ ඉමහත් ලැජ්ජාවකි. ඒත් මගේ කට පණගැන්විනි.



“නෑ නෝන, මට පහුගිය දවස් වල සල්ලි වියදම් වුනා කියල අම්මල පෑනක් අරන් දෙන්නෙ නැතිලු අලුත් පාසලට ගිය දවසේ ඉඳලා ගුටි කනවා, බැනුම් අහනවා, දවසක් පොත් නෑ කියලා, තව දවසක් සපත්තු නෑ කියලා, එහෙමත් නැත්නම් අපිරිසිදුවට ආව කියල, අද පෑනක් නැතුව .... ආයෙ නම් මට ඉස්කෝලේ යන්ට හිතෙන්නෙ නෑ නෝනා....”


“ඕකට පාරට වෙලා හිටියට හරි යනවද ළමයො..... මම පෑනක් දුන්නොත් රංජනී යනවද? ”

නෝනා එහෙම අහන කොට මොන තරම් සතුටක් දැනුනද? “ඔව් නෝනා එහෙනම් හෙට ඉඳලම යනව” මා එසේ පැවසුවේ හද පිරි සතුටිනි.

යමු එහෙනම් අපේ දිහා. නෝනා මාවත් කැටුව ඇගේ නිවසට ගියාය. මම මිදුලේ රැඳුනෙමි.

“මේකට තීන්ත දල තියෙන්නෙ” කියමින් නිල්පාට පෑනක් මා අත තබන විට නොදැනුවත්වම මගේ දෑස් කෙවෙනි තුළට කඳුළු කැට කීපයක් ගලා ආවේය. ඒ සතුටු කඳුළුද වේදනාවේ කඳුළුද කියා මම නොදනිමි. කඳුළු අතරින් නෝනාට ස්තුති කර අපැහැදිලි මාවතට පිවිසුනෙමි.

**ඇනී මියුරියෙල් වික්‍රමරත්න**



## විශ්වාසයේ පියා

**අලෝක සුපුන්**
**03 ශ්‍රේණිය**
**උත්ථානවූ කිතු සමිඳුන්ගේ දහම් පාසල**
**දංකොටුව**



හාල්දඬුවන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයේ අප ස්වාමිදුවගේ දේවස්ථානයට අයත් දූ පුතුන් පනස් හයදෙනකු පසුගිය ද සලාපුර රදගුරු අතඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් අතින් ශුද්ධාත්ම වරම් ලැබුහ. සුදතුම් වරම් ලැබූ ළමුන් සූදානම් කිරීමට සහය වූ ලූර්දු මේරි මහත්මිය , මිල්ටන් අප්පුහාමි මහතාද රදගුරු හිමිපාණන් සහ මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ලාවුස් පියතුමන් ද සමග මෙසේ ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **ටෙක්ලා කල්දේරා - දන්කොටුව**



සේයා :- ශ්‍රියාංගණී පිලිපියා

මරිය තුමී පුංචි කාලේ සිටම දෙවියන් වහන්සේට ප්‍රසන්න ජීවිතයක් ගත කළ කාන්තාවකි. මනුෂ්‍යයකු ලෙසින් පැමිණීමට සිටි දෙවිඳුන්ට තම කුස සතුටින් දුන්නා. ඒ වගේම ආදරය, රැකවරණය , දයාව සහ සෙනෙහසත් දුන්නා. දේව මව වීමේ උත්තරිතර භාග්‍යය ඇය ලබා ගත්තාය. අපි දේව අම්මාට ඉමහත් ගෞරවයත් දැක්විය යුතුය. ඒ ඇය ඔබෙත් මගෙත් ආදර අම්මා නිසායි. අප වෙනුවෙන් ජේසු ළඟ මැදිහත් වන්නේ මේ ආදර අම්මයි. ගලීලයේ කානා නුවර සරණ මංගල්‍යය තුළ මැදිහත් කාරියක් වෙමින් පිහිට වූ ආකාරයටම අද අපට දෙව් මව් පිහිට වෙනවා නොඅනුමානයි. ඒ නිසා මැයි මාසය තුළ පමණක් නොව මුළු ජීවිත කාලය පුරාම දෙව් මව්නට ප්‍රසන්න ජීවිතයක් මෙන්ම අපේ අම්මාට ආදරය ගෞරවය දක්වමින් දෙව් මව් යැදීම කළ යුතුයි.

ජේසුගේ මව වූ අම්මේ
පිච්ච මලින් අප සරසන්නේ.....
මද නල දස අත පැතිරේ
මල් සුවඳින් ලොවම පිදෙන්නේ.....
ඔබයි සුවඳ කුසුමිය අම්මේ
නිමල දෙව් මව් පෙම වඩමින් සොඳිනේ......
ලස්සන ජේසුගේ අම්මේ.........

**ශකිලා මධුෂානි රාජපක්ෂ**
**12 ශ්‍රේණිය (කලා අංශය)**
**ලූර්දු මාතා විදුහල නාත්තන්ඩිය**

**මාසික සිතිවිල්ල**
**ජයග්‍රාහි නිර්මාණය**



සේයා :- ටෙක්ලා කල්දේරා

## මාසික සිතිවිල්ල

"ජූනි මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

## මම යහපත් දරුවෙකු වෙමි

ආදර ජේසුනි ඔබවහන්සේ
මගේ පව් බර කුරුසිය
කර තබාගෙන ගියා පමණක්
නොවේ කුරුසියේ ඇණ ගැසුම්
කෑවා ඒ මා නිසා බව මට දැනේ.

ඔබ වහන්සේ ඒ දුක්බර
ගමන යනවිට ඔබේ ආදර
අම්මාටද හඬන්න ඇති දුකෙන්
මමයි දේව අම්මාට දුක් දුන්නේ
ජේසුනි ඔබටත් ජේසු අම්මාටත්
දුක් නොදෙන්න මම යහපත්
දරුවෙකු වෙමි.

පවුල තුළ ආදරයෙන්
සමගියෙන් සිටිමි. හොඳින්
ඉගෙන ගනිමි. එතකොට
ඔබටත් ජේසු අම්මාටත් සතුටු
වෙන්න පුළුවන් නේද?

**තිවින කෙහාන්**
**5 ශ්‍රේණිය**
**සාන්ත මරියා දහම් පාසල**
**හාල්දඬුවන**